# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව

## 1994 අංක 6 දරණ
## දකුණු පළාතේ
## අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය.

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතිය
(සටහන් කළේ 1994 දෙසැම්බර් මස 02 දින)

දකුණු පළාතේ පළාත් සභාවේ නියමය පරිදි
මුද්‍රණය කරන ලදී.

දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලයෙන්
මිළදී ගත හැක.

ගාල්ලේ ආර්යදාස මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

මිළ: රු. 3/-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දකුණු පළාතේ පළාත් සභාව

1994 අංක 5 දරණ දකුණු පළාත් සභාවේ
අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය.

මෙම ප්‍රඥප්තිය 1994 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.

අධිකරණය විසින් නියම කරනු ලැබ දකුණු පළාතේ 1990 අංක: 07 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ අය කරගත් දඩ සහ දණ්ඩන මුදල දකුණු පළාතේ පළාත් පාලන ආයතන වලට පැවරීම විධි විධාන සැලැස්වීම සඳහා වූ

# ප්‍ර ඥ ප් ති ය කි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1994 අංක: 05 දරණ අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන් වනු ලැබේ.

අධිකරණ දඩ හා දණ්ඩන මුදල් පැවරීම

2. සංශෝධිත පරිදි වූ දකුණු පළාතේ 1990 අංක: 07 දරණ මුදල් ප්‍රඥප්තිය අනුව පළාත් සභාව විසින්, පළාතේ පිහිටා ඇති අධිකරණ විසින් නියම කරන ලද දඩ හා දණ්ඩන මුදල් අය කරගෙන ඇති අවස්ථාවක, ඉහත කී පරිදි එම දඩ හෝ දණ්ඩන මුදල් අයකරගත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත, අදාල පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරයා විසින් ලිඛිතව පළාතේ මුදල් විෂයය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, පළාත් සභාව විසින් එම දඩ හෝ දණ්ඩන මුදල අදාල පළාත් පාලන ආයතනයට පැවරිය හැකිය.

අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ සහතිකය.

3. 2 වන වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් එම දඩ හෝ දණ්ඩන මුදල් ගෙවූ දිනය, එම මුදල් අදාල අධිකරණය විසින් පළාත් සභාවට ප්‍රේෂණය කළ දිනය සහ එම දඩ හෝ දණ්ඩන මුදල නියම කළේ කවර ආඥාපනතක් හෝ පඥ.තක් යටතේ ද යන වග, එහි උපලේඛණයට විශේෂ යොමුකිරීමක් සහිතව ද එම දඩ හෝ දණ්ඩන මුදල් නියම කර අයකරගත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් තත්

කාර්යය සඳහා නම් කල වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබ ඇත්නම් මිස, එවැනි ඉල්ලීමක් වලංගු නො විය යුතු ය.

අර්ථ නිරූපණය

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි

"ප්‍රධාන පරිපාලන නිලධරයා" යන්නෙන්

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, මහ නගර සභා කොමසාරිස් වරයා ද;

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ විට එහි ලේකම්වරයාද අදහස් වෙයි.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක, හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල වලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ.

'පළාත' යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ. "පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ;

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

5. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතා වක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

---

දකුණු පළාත් සභාව මගින් සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 එච්. වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 1994. 12. 02 දින අනුමත කර ඇත.

---